සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education, Southern Province Department of Educ

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

තෙවන වාර පරීක්ෂණය - 2020
Third Term Test - 2020

11 ශ්‍රේණිය
Grade 11

භූගෝල විද්‍යාව - I

පැය එකයි
One hour

උපදෙස් :
- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය.
- එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01 පෘථිවිය මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් මිලියන .... කි. (610 / 510 / 910)

02 පෘථිවි වායුගෝලයේ වැඩි වශයෙන් ව්‍යාප්තව ඇති වායු වර්ගය වන්නේ .... ය. (නයිට්‍රජන් / ඔක්සිජන් / කාබන්ඩයොක්සයිඩ්)

03 උෂ්ණත්වය, උන්නතාංශය සමග ක්‍රමයෙන් ඉහළ යාම .... වේ. (වායු පීඩනය / සාපේක්ෂ ආර්ද්‍රතාව / පතන ශීඝ්‍රතාව)

04 වර්ෂණය මගින් පෘථිවිය මතට වැටෙන ජලය කොටසක් භූමිය මතුපිට ගලායාම .... ලෙස හැඳින්වේ. (අපධාවය / කාන්දුවීම / වැස්සීම)

05 පෘථිවි ගෝලය මත නිරන්තර ක්‍රියාකාරීත්වයෙන් යුතු ශාක සහ සත්ත්ව විශේෂ ඇතුළත් සමස්ත ජීවී පරිසරය .... ලෙස හැඳින්වේ. (වායුගෝලය / ජෛවගෝලය / ජල ගෝලය)

- අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.

06 ආග්නේය පාෂාණ මූලික පාෂාණ ලෙස ද හඳුන්වයි. (නි / වැ)

07 මිනිරන් ලෝහමය ඛනිජ වර්ග යටතට ගැනේ. (නි / වැ)

08 ලෝකයේ වාර්ෂික මිනිරන් නිෂ්පාදනයෙන් 60% ඉන්දියාව විසින් නිපදවයි. (නි / වැ)

09 ශ්‍රී ලංකාවේ මීටර් 610 ට අඩු උස්බිම්වල පහතරට තේ වගාව ව්‍යාප්ත වී ඇත. (නි / වැ)

10 ටිටිකාකා විල ලෝකයේ උසම ස්ථානයක පිහිටි විල වේ. (නි / වැ)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11 වායුගෝලයේ පහළම ස්ථරය .... ගෝලය නම් වේ.

12 පෘථිවිය මතුපිට සිට අභ්‍යන්තරයට යන විට උෂ්ණත්වය ක්‍රමයෙන් .... වේ.

13 ගොඩබිම පිහිටි ජලය පිරි ආවාට හැඳින්වෙන්නේ .... නමිනි.

14 ශ්‍රී ලංකාවේ වානිජ හා පරිපාලන කටයුතු, අධ්‍යාපන හා සේවා වැඩිපුර ඒකරාශි වී ඇත්තේ .... දිස්ත්‍රික්කයේ ය.

15 මෑත කාලයේ ලොව පුරා ව්‍යාප්තව ඇති කොවිඩ් 19 වසංගත රෝගය .... උපද්‍රව ගණයට අයත් වේ.

EXAMRESULTS.LK

- පහත දී ඇති ප්‍රස්තාරය හොඳින් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



16 මුළු ජන සංඛ්‍යාව වැඩිම පළාත කුමක් ද? ....

17 මුළු ජන සංඛ්‍යාව හා සාඵල්‍යතා අනුපාතය අතර වැඩිම පරතරයක් ඇති පළාත කුමක් ද?

....

18 මුළු ජන සංඛ්‍යාව අඩුම පළාත කුමක් ද? ....

19 සාඵල්‍යතාව වැඩිම පළාත කුමක් ද? ....

20 මුළු ජන සංඛ්‍යාව හා සාඵල්‍යතා අනුපාතය ආසන්න වශයෙන් සමාන මට්ටමක පවතින පළාත කුමක් ද?

....

- අංක 21 සිට 25 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

21

'අ'	'ආ'
අපනයන ගම්මාන	අපනයන බෝගය
1. රාජාංගනය	A කජු
2. දඹදෙණිය	B මිරිස්
3. කටුගම්පොල	C බුලත්
	D ගම්මිරිස්

(1) A, B, C (2) B, A, C (3) C, B, D (4) D, A, C (..........)

22

'අ'	'ආ'
වායුගෝලීය ස්ථර	විශේෂ ලක්ෂණ
1. පරිවර්ති	A ඕසෝන් ස්ථරය පිහිටීම
2. අපරිවර්ති	B විද්‍යුත් ක්‍රියාවලි සිදුවීම
3. මෙසෝ	C සියලු මිනිස් ක්‍රියාකාරකම් සිදුවීම
	D උෂ්ණත්වය වැඩිවීම

(1) A, B, D (2) B, A, C (3) C, A, B (4) D, A, C (..........)

23 'අ' 'ආ'

අකුණු වර්ගය		අකුණු ඇතිවන අයුරු	
1.	වලා අකුණු	A	වළාකුළු හා වළාකුළු අතර
2.	වායු අකුණු	B	පෘථිවිය හා අවකාශය අතර
3.	පෘථිවි අකුණු	C	වළාකුළු හා අවකාශය අතර
		D	වළාකුළු හා පෘථිවිය අතර

(1) A, C, D (2) B, A, C (3) C, D, A (4) D, A, C (...........)

24 'අ' 'ආ'

කර්මාන්තය		ව්‍යාප්තවී ඇති ප්‍රදේශ	
1.	බෝට්ටු නිෂ්පාදනය	A	අඹේවෙල
2.	කිරිපට්ටි පාලනය	B	කොග්ගල
3.	බීරලු කර්මාන්තය	C	බේරුවල
		D	පිළිමතලාව

(1) A, B, D (2) B, D, A (3) C, D, A (4) C, A, B (...........)

25 'අ' 'ආ'

ප්‍රධාන දේශගුණික කලාප		විශේෂිත දේශගුණ වර්ගය	
1.	නිවර්තන	A	තුන්ද්‍රා
2.	සෞම්‍ය	B	මෝසම්
3.	ශීත	C	මධ්‍ය ධරණී
		D	ශුෂ්ක

(1) A, C, D (2) B, C, A (3) C, A, D (4) B, C, D (...........)

- **අංක 26 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

26 * 2000 mm වැඩි වර්ෂාපතනය

* 27 ºC පමණ සාමාන්‍ය උෂ්ණත්වය

* කබොක් මිශ්‍ර රතු පස

ඉහත සාධක වලට වඩාත් උචිත වන බෝගය වන්නේ,

(1) තේ (2) පොල් (3) රබර් (4) වී (...........)

27 කල්පැවැත්ම, ශක්තිය, දරා සිටීමේ හැකියාව, නම්‍යශීලී බව, කම්පනයට ඔරොත්තු දීම, ලාභදායී නිෂ්පාදනයක් වීම යන ගුණ ලක්ෂණ ඇති නිෂ්පාදන කර්මාන්තය වන්නේ,

(1) මිනිරන් (2) යකඩ හා වානේ (3) ගල් අඟුරු (4) ෆයිබර් (...........)

28 පහත සඳහන් ධීවර වරායන් අතුරෙන් යෝජිත ධීවර වරායක් වන්නේ මින් කුමක් ද?

(1) ගාල්ල (2) දෙවුන්දර (3) මයිලට්ටි (4) හම්බන්තොට (...........)

29 වියලි කලාපීය භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ,

(1) විශාල කුඹුරු යායන් තිබීම. (2) හෙල්මළු ක්‍රමයට වගා කිරීම.

(3) විශාල තට්ටු ගොඩනැගිලි තිබීම. (4) තේ වගාව ව්‍යාප්ත වී තිබීම (...........)

30 රතු දුඹුරු ලැටසෝල් පස වැඩි වශයෙන් ව්‍යාප්ත වූ කලාපය වන්නේ,

(1) ශුෂ්ක කලාපය (2) වියලි කලාපය

(3) තෙත් කලාපය (4) ගංගා ආශ්‍රිත පහත් බිම් (..........)

31 ශ්‍රී ලංකාවේ 2012 ජන සංගණනයට අනුව නාගරික ජන සංඛ්‍යාව

(1) 18.3% (2) 77.3% (3) 20.3% (4) 4.4% (..........)

32 වීදුරු නිෂ්පාදනයේදී ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස යොදාගන්නා ඛනිජ වර්ගය කුමක් ද?

(1) රූටයිල් (2) මයිකා (3) ඉල්මනයිට් (4) සිලිකා (..........)

33 අක්ෂාංශ 30° ත් 50° අතර ව්‍යාප්තව ඇති තද අරටු හා පළල් පත්‍ර වලින් යුතු සිසිරයේ ගස්වල කොළ හැලෙන ඕක්, චෙස්නට් වැනි ශාක බහුලව ඇත්තේ කවර වනාන්තරවල ද?

(1) සෞම්‍ය (2) කේතුධර (3) සමක (4) මෝසම් (..........)

34 ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් වැඩි වශයෙන් භාවිත කරනු ලබන්නේ,

(1) කෘෂිකාර්මික කටයුතු සඳහා (2) ගෘහස්ත කටයුතු සඳහා

(3) ප්‍රවාහන කටයුතු සඳහා (4) වෙනත් කටයුතු සඳහා (..........)

35 මිනිසා විසින් සම්පත් ප්‍රයෝජනයට ගැනීමේදී ගිලා ගෝලයට සිදුවන බලපෑමක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) භූගත ජල මට්ටම වෙනස් වීම (2) භූමි හායනය

(3) ගෝලීය උණුසුම පාලනය වීම (4) මතුපිට භූ දර්ශනය වෙනස් වීම (..........)

- **පහත A, B, C, D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට 36 - 39 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

A පොසිල ඉන්ධන දහනය
ඕසෝන් ස්තරය ක්ෂයවීම

B පාංශු ඛාදනය
කෘෂි අස්වැන්න

C දළ මරණ අනුපාතිකය
වැඩිහිටි ජන සංඛ්‍යාව

D මුළු ජන සංඛ්‍යාව
අකුණු කුණාටු

36 එක් සාධකයක වැඩිවීම අනෙක් සාධකයේ අඩුවීමට බලපාන අදහස් යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (..........)

37 එක් සාධකයක වැඩිවීම අනෙක් සාධකයේ ද වැඩිවීමට හේතුවන අදහස් යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (..........)

38 පළමු සාධකයේ අඩුවීම දෙවන සාධකයේ වැඩිවීමට හේතුවන අදහස් යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (..........)

39 සාධක දෙක අතර සම්බන්ධතාවයක් නොදක්වන ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (..........)

40 ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව බෙදා ඇති සංචාරක කලාප ගණන කීය ද?

(1) 3 (2) 4 (3) 6 (4) 7 (..........)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

තෙවන වාර පරීක්ෂණය - 2020
Third Term Test - 2020

11 ශ්‍රේණිය Grade 11	භූගෝල විද්‍යාව - II	පැය දෙකයි Two hours

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) යන කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.
- II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

I - කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදාගන්න.

අංක (i) සිට (v) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) A - B අක්ෂර වලින් දක්වා ඇති බෑවුම කුමක් ද?

(උත්තල බෑවුම / මද බෑවුම / දළ බෑවුම)

(ii) C - D අක්ෂර වලින් දක්වා ඇත්තේ කුමක් ද?

(දුර්ගය / නිම්නය / කපොල්ල)

(iii) අංක (1) න් දක්වා ඇත්තේ කුමක් ද?

(වනාන්තර / ලඳු කැළෑ / හේන)

(iv) අංක (2) න් දක්වා ඇත්තේ කුමක් ද?

(ගල්වල / ගල / රක්ෂිත මායිම)

(v) අංක (3) න් දක්වා ඇත්තේ කුමක් ද?

(පළාත / උප දිසාපති කොට්ඨාසය / දිස්ත්‍රික්කය)

(vi) ප්‍රදේශයේ දක්නට ලැබෙන ව්‍යාපාරික බෝගය කුමක් ද?

(vii) E අක්ෂරයෙන් දක්වා ඇති රේඛාව කුමක් ද?

සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ තුනක් (viii), (ix), (x) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් 'නි' යන්න ද, වැරදි නම් 'වැ' යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(viii) සිතියම්ගත ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගයේ දිග කි.මී. 10 කි.

(ix) සිතියම්ගත ප්‍රදේශය තැනිතලා බිමක් බව පෙනේ.

(x) මෙම ප්‍රදේශයෙහි ජල සම්පාදනය බහුලව සිදුවන්නේ වැව් මගිනි.

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති තීරුව යොදාගන්න.

(i) කොවිඩ් 19 මුලින්ම ව්‍යාප්ත වූ වූහාන් නගරය - A B C

(ii) මරේඩාලිං ගංගාව - G H J

(iii) රොකී කඳුවැටිය - G H J

(iv) බෝල්ටික් මුහුද - K L M

(v) ෆෝක්ලන්ඩ් දූපත - P Q R

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය්‍යය කර කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබද තීරුව යොදාගන්න.

(i) ගම්පහ දිස්ත්‍රික්කය - A B C

(ii) විල්පත්තු ජාතික උද්‍යානය - D E F

(iii) රසායනික ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව පිහිටි පරන්තන් - G H J

(iv) මොනරාගල නගරය - K L M

(v) කළු ගඟ - N R Q

II - කොටස

(02) (i) පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්තර යාබද රූපයේ දක්වේ. A, B ස්ථර පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)



(ii) ඔබ නම් කළ A කලාපයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) පස නිර්මාණයට බලපාන සාධක තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) වායුගෝලය ස්තරවලට බෙදීමේ දී පදනම් කරගනු ලබන සාධක දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) පරිවර්ති ගෝලයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ජීවීන්ට ඕසෝන් ස්තරයෙන් ලැබෙන ප්‍රයෝජනයක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ජෛව ගෝලයේ සමතුලිතබව බිඳවැටීමට වනාන්තර විනාශ කිරීම හේතු වන්නේ කෙසේදැයි කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(04) (i) පහත වරහන් තුළ දක්වා ඇති ස්වාභාවික සම්පත්

(a) නිරායාසයෙන් ලැබෙන

(b) ආයාසයෙන් ලබා ගන්නා සම්පත් ලෙස වර්ග කරන්න.

(වාරි ජලය / වනාන්තර / ඛනිජ සම්පත් / ජලය) (ලකුණු 02)

(ii) පාෂාණ වල උපත සිදුවන ආකාරය අනුව වර්ග තුනකි. ඒවා නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ශ්‍රී ලංකාවේ භූගත ජල ද්‍රෝණි දෙකක් නම් කරන්න. එම ජලය ප්‍රයෝජනයට ගන්නා ආකාරයක් සඳහන් කරන්න. (ලකුණු 03)

(05) (i) යාබද සිතියමේ 1, 2, 3 හා 4 ලෙස දක්වා ඇති වෘක්ෂලතා කලාප පහත වරහන් තුළින් තෝරා පිළිවෙලින් ලියන්න. (ලකුණු 02)

(නිවර්තන තෙත් වනාන්තර / කඳුකර තෙත් කලාපීය වනාන්තර / කඩොලාන / කටු පඳුරු හා ලඳු කැලෑ / වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර)



(ii) ශ්‍රී ලංකාවේ නිවර්තන තෙත් වනාන්තරවල විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) වනජීවී රක්ෂිත ප්‍රදේශ ඇතිකිරීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) වන සම්පත් හා වන ජීවීන් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(06)



(i) ඉහත ලෝක සිතියමේ A හා B වශයෙන් තේ වගා කරන රටවල් දෙකක් දක්වා ඇත. ඒවා පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) ලෝකයේ වතු කෘෂි කර්මාන්තයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ තේ වගාව ආශ්‍රිත ගැටලු තුනක් දක්වන්න.

(b) ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) යකඩ හා වානේ නිෂ්පාදනයට වැදගත් වන

(a) ජපානයේ මධ්‍යස්ථානයක් ද

(b) එක්සත් රාජධානියේ මධ්‍යස්ථානයක් ද පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) යකඩ හා වානේ කර්මාන්තයේ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ලෝක විද්‍යුත් කර්මාන්තයේ ආසියාවේ ප්‍රමුඛ රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(b) ලෝක විද්‍යුත් කර්මාන්තයේ ලක්ෂණ දෙකක් දක්වා ප්‍රවණතා එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(08) (i) යාබද සිතියමේ A හා B ලෙස දක්වා ඇති ධීවර වරායන් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) කරදිය ධීවර කර්මාන්තයේ ප්‍රධාන අංශ දෙක නම් කරන්න.

(b) කිවුල් දිය ධීවර කර්මාන්තය ආශ්‍රිතව බහුලව ඇති කරනු ලබන මසුන් වර්ගයක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටලු තුනක් හා ප්‍රවණතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)



භූගෝල විද්‍යාව II

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

(01) / (அ) / (ආ)

(i) ....

(ii) ....

(iii) ....

(iv) ....

(v) ....

(vi) ....

(vii) ....

(viii) ....

(ix) ....

(x) ....

10

01 (ආ)



(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (ඉ)



(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (අ) /10 + (ආ) /5 + (ඉ) /5 = /20

පිළිතුරු පත්‍රය - I පත්‍රය

01 510	11 පරිවර්ති	21 (2)	31 (1)
02 නයිට්‍රජන්	12 වැඩි	22 (3)	32 (4)
03 පතන ශීඝ්‍රතාව	13 විල්	23 (1)	33 (1)
04 අපධාවය	14 කොළඹ	24 (4)	34 (3)
05 ජෛවගෝලය	15 ජීව විද්‍යාත්මක	25 (2)	35 (3)
06 නි	16 බස්නාහිර	26 (3)	36 (2)
07 වැ	17 බස්නාහිර	27 (2)	37 (1)
08 නි	18 උතුරු මැද	28 (3)	38 (3)
09 නි	19 නැගෙනහිර	29 (1)	39 (4)
10 නි	20 දකුණ	30 (3)	40 (4)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

II පත්‍රය

I - කොටස

(01) (අ) (i) මද බෑවුම (ii) කපොල්ල (iii) වනාන්තර (iv) ගල

(v) උප දිසාපති කොට්ඨාසය (vi) පොල්

(vii) ඛණ්ඩාංක රේඛාව / ජාතික ඛණ්ඩාංක / 155 ඛණ්ඩාංක රේඛාව

(viii) වැ (ix) නි (x) නි

(ආ) (i) B (ii) D (iii) J (iv) K (v) R

(ඉ) (i) B (ii) D (iii) J (iv) K (v) N

II - කොටස

(02) (i) A කබොල B ප්‍රාවරණය

(ii) * ශිලාගෝලයට අයත් ය. එය පෘථිවි ස්කන්ධයෙන් 1/4 ක් පමණ වේ.
* ඝනකම ඒකාකාරී නොවේ.
* විවිධ පාෂාණ වලින් සමන්විතය
* ඛනිජ වර්ග ඇත
* මහාද්වීපික හා සාගරික කබොල ලෙස කොටස් දෙකකි.

(iii) මව් පාෂාණ / භූ විෂමතාව / දේශගුණය / කාලය / ශාක හා සත්ත්ව කොටස් / මානුෂ ක්‍රියා
(අදාල පරිදි විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.)

(03) (i) උෂ්ණත්වය හා උන්නතාංශය (උස)

(ii) * පෘථිවි පෘෂ්ඨයේ 8 km - 12 km පමණ දක්වා විහිදේ
* උන්නතාංශය සමග උෂ්ණත්වය පහළ බසී. (පතන ශීඝ්‍රතාවය)
* සියලුම කාලගුණ සංසිද්ධීන් ඇතිවන්නේ මෙම කලාපයේ ය.
* ජෛවගෝලයේ පැවැත්ම සඳහා මෙහි ක්‍රියාකාරීත්වය වැදගත් ය.
* සාමාන්‍ය ගුවන් යානා පියාසර කරන්නේ මෙහි ඉහළ මායිමට ආසන්නව ය.

(iii) (a) අහිතකර වායූන් පෘථිවි තලයට ඒම වැළැක්වීම, වායු පෙරණයක් සේ ක්‍රියා කිරීම

(b) * සත්ත්ව වාසභූමි විනාශ වීම
* ජෛව පද්ධති විනාශ විම
* මතුපිට පස සේදීයාම
* පස නිසරු වීම (අදාළ පරිදි විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.)

(04) (i) (a) ආයාසයෙන් - වාරි ජලය, ඛනිජ සම්පත්
නිරායාසයෙන් - වනාන්තර, ජලය

(ii) ආග්නේය / අවසාදිත / විපරීත

(iii) (a) ගංගා / වැව් / ළිං / උල්පත් / නල ළිං / ජලාශ / ඇළ දොළ

(b) වනාතවිල්ලු / මන්නාරම / මුලුන්කාවිල් / ආඬියා ළිං / වගා ළිං / නල ළිං

(05) (i) 1. නිවර්තන තෙත් වනාන්තර 2. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර
3. කටු පඳුරු හා ලඳු කැළෑ 4. කඩොලාන

(ii) * ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය පහත් බිම්වල හා කඳුකර ප්‍රදේශවල ව්‍යාප්තව ඇත.
* අවුරුද්ද මුළුල්ලේම ශාක වැඩීමට අවශ්‍ය වර්ෂාපතනයක් හා උෂ්ණත්වයක් පැවතිම.
* වනාන්තර කොළ පැහැති වන අතර වියන් ස්තර කිහිපයකින් යුක්ත වේ.
* හොර, කීන, ගොඩපර, කිරිහැඹිලිය, බටු නා

(iii) (a) * පරිසර පද්ධති හා සත්ත්ව සංහතිය ආරක්ෂා කර ගැනිම.
* ස්වභාවික සෞන්දර්ය ආරක්ෂා කර ගැනීම.
* විද්‍යාත්මක පර්යේෂන කටයුතු සිදුකිරිමට අවකාශ ලැබීම.

(b) * ජාතික රක්ෂිත හා අභයභූමි පවත්වාගෙන යාම
* වන වගා ව්‍යාපෘති ඇතිකිරීම (සෝල්ට් ක්‍රමය, තෙත් බිම් හා කඩොලාන බිම් රැක ගැනීම)
* ප්‍රජා සහභාගීත්වයෙන් වන වගාව දිරිගැන්වීම
* රුක් රෝපණය හා වනාන්තරවල ඵලදායිතාව වර්ධනය කිරීම
* ජනතාව දැනුවත් කිරීම
* පරිසර සංවේදි කලාප ඇති කිරීම
* පවතින නීති රීති බලගැන්වීම

(06) (i) A කෙන්යාව B ඉන්දියාව

(ii) * විශාල වතු වශයෙන් ව්‍යාප්ත වීම හා මුළුමනින්ම ව්‍යාපාරික ස්වරූපයක් ගැනීම
* වතු වගාවේදී දේශීය ශ්‍රමය මෙන් ම විදේශීය ශ්‍රමය ද භාවිත වීම
* පුහුණු ශ්‍රමය භාවිත වීම හා විධිමත් ශ්‍රම සංවිධානය කිරීම
* කෘෂිකාර්මික ක්‍රමයක් වුවද කාර්මික ලක්ෂණ පෙන්නුම් කිරීම
* විදේශ විනිමය ලබාදෙන අපනයන බෝග වීම
* බොහෝ රටවල වතු කෘෂිකර්මය විදේශිකයන් විසින් ආරම්භ කර තිබීම

(iii) (a) * ඉඩම් හිඟය හා ඉඩම් කැබලි වීම
* එකම බිමක දීර්ඝ කාලීනව වගා කටයුතු සිදුකිරීම නිසා අස්වැන්න අඩුවීම
* වතු පැරණි වීම නිසා අස්වැන්න අඩුවීම
* බිම් ඒකකයකින් ලබාගන්නා අස්වැන්න අඩුවීම
* කම්කරු ගැටලු හා වෘත්තීය සමිති ගැටලු ඇතිවීම
* වෙනත් රටවලින් එල්ලවන තරගය

(b) * කෘෂි කාර්මික නිෂ්පාදන විවිධාංගීකරණය, ක්ෂණික තේ, හරිත තේ ආදී .....
* පාරිභෝගිකයන්ගේ සිත් ඇදගන්නා අයුරින් ආකර්ෂණීය ලෙස නිෂ්පාදන සකස් කිරීම
* නවීන ඇසුරුම් ක්‍රම භාවිතය
* පොහොර සහනාධාර සැපයීම
* විද්‍යුත් උපකරණ නිෂ්පාදනය හා අළෙවියට වඩා අතුරු නිෂ්පාදන වෙළඳපොලක් නිර්මාණය වීම
* එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස පවත්වාගෙන යාම

(07) (i) ජපානය - ඔසාකා, කෝබේ, කියොතෝ, ටෝකියෝ, යොකොහාමා, නාගොයා
එක්සත් රාජධානිය - බර්මින්හැම්, දකුණු වේල්ස්, ලැන්කැෂියර්

(ii) * වෙනත් ලෝහවලට මිශ්‍ර කිරීමෙන් ගුණාත්මක භාවය වැඩිදියුණු කර ගැනීම
* ප්‍රතිචක්‍රීකරණය පහසු වීම
* මූලික ලෝහයක් ලෙස සෑම රටකම භාවිතයට ගැනීම
* කම්පනයට ඔරොත්තු දීම
* ශක්තිය දරාසිටීමේ හැකියාව
* කල්පැවැත්ම

(iii) (a) චීනය / ජපානය

(b) ලක්ෂණ
* විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කළ යුතු වීම
* අවසන් නිමැවුම දක්වාම නිරන්තරයෙන් පර්යේෂණ සිදුකිරීම
* නිෂ්පාදනයට වඩා දෙගුණයක් පර්යේෂණ සඳහා මුදල් වැය කිරීම
* ශ්‍රමිකයන් විශාල පිරිසක් ඉංජිනේරුවන් පුහුණු කාර්මික ශිල්පීන්, විද්‍යාඥයන් හා පර්යේෂකයන් වීම
* නිෂ්පාදන බහුජාතික සමාගම් සතුවීම

ප්‍රවණතා
* වෙළඳපොල තරගකාරීත්වයට ගැළපෙන පරිදි නව නිෂ්පාදන එළිදැක්වීම
* ඉතාමත් සංකීර්ණ සූක්ෂම හා උපාංග නිපදවීම

(08) (i) A බේරුවල B තංගල්ල

(ii) (a) 1. වෙරළබඩ ධීවර කර්මාන්තය / මහාද්වීප තටකය තුළ
2. ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය

(b) ඉස්සන් / පොකිරිස්සන් / කකුළුවන්

(iii) ගැටලු
* ධීවර ආම්පන්න සඳහා පිරිවැය ඉහළ යාම
* අහිතකර උපකරණ භාවිතය හා හානිකර ක්‍රමවේද භාවිතය
* ඉන්ධන මිල ඉහළ යාම
* ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම
* යන්ත්‍ර සූත්‍ර මිල ඉහළ යාම

ප්‍රවණතා
* දේශීය පරිභෝජනය ඉහළ යාම
* නවීන තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර යොදාගැනීම
* වෙළඳපොල සේවා පුළුල් කිරීම
* ධීවර ගම්මාන ඇතිකිරීම
* නව වරායන් හා බෝට්ටු අංගන ඉදිකිරීම